# 10

# බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සහජීවනයෙන් ක්‍රියා කරමු

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ථේරවාදී බුදුසමය හඳුන්වා දීමත් සමග ම එතෙක් අප රටේ පැවැති සංස්කෘතිය බෞද්ධ සංස්කෘතිය බවට පරිවර්තනය විය. මෙකී සංස්කෘතිය නිසා ජනතාවගේ බුද්ධිය, ක්‍රියාකාරිත්වය හා පුද්ගල සබඳතා ඉතා ඉහළ ම මට්ටමකින් පෝෂණය විය.

රටක අනාදිමත් කාලයක පටන් පවත්නා සංස්කෘතියට නව සංස්කෘතියක් ආදේශ කරවීම කිසි සේත් ම පහසු කටයුත්තක් නොවේ. එය විචාරශීලී බුද්ධිමය පදනමක පිහිටා රටේ පවත්නා සංස්කෘතියට ද හානියක් නොවන ලෙස සිදු කළ යුත්තකි. මෙහි දී මිහිඳු මහරහතන් වහන්සේ සිදු කළේ ප්‍රාග් බෞද්ධ යුගයේ (ලංකාවට බුදුසමය හඳුන්වා දීමට පෙර) පැවැති සංස්කෘතිය වටහාගෙන එහි ම හරවත් පරිවර්තනයකි. පැවැති සංස්කෘතිය හෙළා දක විවේචනය කිරීමවත්, එය සහමුලින් ම ප්‍රතික්ෂේප කිරීමවත් සිදු නොවුණි. මිහිඳු මහරහතන් වහන්සේගේ දූරදර්ශී වැඩ පිළිවෙළ නිසා ම එකල වෘක්ෂ දේවතාවුන් ඇදහූවෝ බෝධි වන්දනාවට හා බෝධිපූජා සිදු කිරීමට පෙළඹුණහ. ගිනිදෙවියන් පිදූවෝ බුදුරදුන් පිදූහ. මළවුන් ඇදහූවෝ මළවුන්ට පින් අනුමෝදන් කරවීමෙන් එයට නව අරුතක් එක් කළහ. ගල් පර්වතවලට වන්දනාමාන සිදු කළෝ බුදුගුණ සිහි කර චෛත්‍ය හා බුදුපිළිමවලට වන්දනා කළහ. දෙවියන් ඇදහූවෝ දෙවියන්ට පින් දීමට හුරුපුරුදු වූහ. මේ අනුව පැහැදිලි වන්නේ අනවබෝධය නිසා යම් යම් නිරර්ථක ආගමික සංස්කාරවිධි හුරු පුරුදු වූ ජනතාව බුද්ධිමත් ව සිතීමට හුරුපුරුදු වීමත් සමග ම හරවත් ආමිස හා ප්‍රතිපත්ති පූජාදිය කෙරෙහි කෙමෙන් නැඹුරු වූ බවයි. වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි යන සංස්කෘතික සංකල්පය, අපගේ ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව මනා ව මූර්තිමත් වන අවස්ථාවක් ලෙස හඳුන්වාදිය හැකි ය. බෞද්ධයන් ලෙසත්, ශ්‍රී ලාංකිකයන් ලෙසත් අපි අපට ම අනන්‍ය වූ ආගමික හා ජාතිකත්වයක් ඇත්තෝ වෙමු.

බෞද්ධ ආභාසයෙන් පෝෂණය ලැබූ පුරාතන රජවරු වෙහෙර විහාර ආදිකොට ඇති ආගමික ගොඩනැගිලි තැනීමෙන් ජනතාවගේ සදාචාර සම්පන්න ජීවිතය පෝෂණය කළහ; වැව් අමුණු ආදිය තැනීමෙන් රටේ ආර්ථිකය ශක්තිමත් කළහ. ඒ ඔස්සේ බෞද්ධ සංස්කෘතිය හා බැඳුණු මෙරට ජනතාව මවුපිය-දූදරු, ස්වාමි-භාර්යා, ගුරු-සිසු,

සේව්‍ය-සේවක යුතුකම් හා ඥාති සංග්‍රහ හොඳින් හැඳිනගෙන ඒ අනුව ඔපවත් වූ සුඛිත මුදිත ජීවිත ගත කළහ. පරපීඩනය, සත්ත්ව ඝාතනය හෙළා දුටුවහ. අවිහිංසාව අගය කළහ. ජීවී අජීවී සමස්ත පරිසරය කෙරෙහි ම බෙහෙවින් හිතකර ආකල්පයක් දැක්වූහ. ආගමික පුදසිරිත් හා වතාවත්වලට මුල්තැන දී සෑම ව්‍යාපාරයක් ම ආරම්භ කළහ. එහි ආරක්ෂාව, ව්‍යාප්තිය, සංවර්ධනය, චිරස්ථිතිය හා අන්‍යෝන්‍ය සුහදතාව එයින් අපේක්ෂා කළහ. සියලු ම උත්සව බෞද්ධ සංස්කෘතිය හා සම්බන්ධ වතාවත්වලට මුල්තැන දී සිදු කළහ. මෙසේ බුදුසමය හා ලාංකික සමාජය අතර සම්බන්ධතාව කෙතරම් සමීප වූයේ ද යත් බුදුදහමින් තොර ව ලාංකික සමාජයක් පිළිබඳ කතා කිරීමට ද නො හැකි ය. ලංකාවේ රාජ්‍ය ආගම බුද්ධාගම වීමත්, රජු බෞද්ධයකු විය යුතු ය යන සම්මතයත් ඇති වූයේ බුදුදහම හා ශ්‍රී ලාංකික ජන සමාජයේ සබැඳියාව මෙලෙස ශක්තිමත් වීමේ ප්‍රතිඵලයක් ලෙසයි.

මෙලෙස බෞද්ධ ඉගැන්වීම් ඔස්සේ ගොඩනැගුණු ශ්‍රී ලාංකික අනන්‍යතාව හා සහජීවනය පදනම් කරගෙන සමස්ත ලෝකයාගේ ම ගෞරවාදරයට ලක්වීමට බෞද්ධයාට වාසනාව උදාවුණි. එහෙත් ඊට පටහැනි ව යමින් ජාති, කුල, ආගම්, පක්ෂ, පළාත් වශයෙන් භේද වැපිරීමටත් මිනිස් අයිතිවාසිකම් යටපත් කිරීමටත් යමකු ක්‍රියා කරන්නේ නම් එය බෞද්ධ ඉගැන්වීම්වලට ප්‍රතිවිරුද්ධ ය. සෑම දෙනකු ම එක ම මිනිස් වර්ගයකට අයත් ඒකාකාරී පැවැත්මක් ඇති ව ජීවත් වන පිරිසක් බව වටහාගෙන සමානාත්මතාවෙන් යුතු ව බුද්ධිමත් ව ක්‍රියා කිරීම අන්‍යෝන්‍ය යුතුකම් වර්ධනය වීමට හේතු වේ.

වෙනත් සත්ත්ව වර්ගයා අතර ජීව විද්‍යාත්මක වෙනස්කම් දැක්වීමට බොහෝ සාධක පැවැතිය ද මිනිසා පිළිබඳ ව එබඳු වෙනස්කම් දැක්විය නොහැකි බව බුදුදහමෙහි නිදසුන් සහිත ව දක්වා තිබේ. මිනිසුන්ගේ සිරුරු වෙන් වෙන් වශයෙන් ගත් කල වෙනසක් නැති බවටත්, ලිංග ජාති වශයෙන් සමානත්වයක් ඇති බවත් වාසෙට්ඨ සූත්‍රයේ සඳහන් වෙයි.

පුද්ගලයාගේ චරිත සංවර්ධනය ඇති කරවන හා සමාජ සම්බන්ධතා තහවුරු කෙරෙන පිළිවෙත් වශයෙන් සිගාලෝවාද සූත්‍රයේ දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව හා සමානාත්මතාව යන සතර සංග්‍රහ වස්තු ඉගැන්වෙයි. දානය හෙවත් පරිත්‍යාගය බෞද්ධයන්, ජාතිය ආගම ආදි විසමතා සලකා සිදු කරන්නක් නොවේ. පිරිසිදු සිතින් ඕනෑ ම පුද්ගලයකුට යමක් පරිත්‍යාග කිරීම පින්කමකි. තිරිසන් සතකුට වුව ද දන් දීම උතුම් ම ය. ප්‍රියවචන කතා කිරීම හා අර්ථ චර්යාව හෙවත් අනුන්ගේ දියුණුවට උදවු කිරීමට ද ජාති ආගම් භේද සලකා බැලිය යුතු නොවේ. සියලු සත්ත්වයන් පිළිබඳ සමානාත්මතාවෙන් ක්‍රියා කළ යුතු ය. ජාතික ආගමික සහජීවනය ගොඩ නැගෙන්නේ එසේ ක්‍රියා කළහොත් පමණකි. ඒ බව එදා පටන් ම මෙරට බෞද්ධයෝ දැන සිටියහ.

විවිධ සංස්කෘතීන්ට අනුව හැඩ ගැසුණු අන්‍ය ජාතීන් හා අන්‍ය ආගමිකයින් වෙසෙන සමාජ වටපිටාවක අපට ජීවත් වීමට සිදුවූයේ යැයි සිතමු. ඔවුන් සමග මතවාද, ගැටුම් ඇතිකර ගන්නා තැනැත්තා බුදුදහමෙහි එන සහජීවන ප්‍රතිපත්තියට පිටුපාන්නකු බවට පත් වේ. සමාජයේ එක් කොටසකට පමණක් නොව සියලු දෙනා කෙරෙහි ම

අප මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණය පැතිරවිය යුතු ය. වෛරයෙන්, ද්වේෂයෙන් තොර මනසින් සමස්ත සත්ත්ව වර්ගයා ම මා වැනි යැයි සිතමින් මෙත් වැඩීම ද, අනුන්ගේ දුක දැක හදවතේ අනුකම්පා සිතුවිලි ජනිත කර ගැනීම ද, සැපසේ ජීවත්වන පුද්ගලයන් දැක හෝ අසා ඔවුනට ඊර්ෂයා නොකොට මොවුහු යහතින් වෙසෙත් යනුවෙන් සතුටු සිත් ඇති කර ගැනීම නම් වූ මුදිතාව ද සැමවිට ම මධ්‍යස්ථ ව සිතා කටයුතු කිරීම නම් වූ උපෙක්ඛාව ද අප මැනැවින් පුරුදු පුහුණු කළ යුතු ය.

මෙසේ බැලූ කල එක ම බෞද්ධ ඉගැන්වීමකවත් ජාති, ආගම්, කුල භේද අනුමත කිරීමක් සිදුකර නොමැත. බෞද්ධයාගේ නිත්‍ය සීලය වන පංච සීලය ද ඊට උදාහරණයකි. පළමු සිල් පදයෙහි එන පරිදි ස්වකීය ජීවිතයට තමා බෙහෙවින් ප්‍රිය කරන්නාක් මෙන් අන්‍යයෝ ද තම තමන්ගේ ජීවිතවලට බෙහෙවින් ප්‍රිය කරති. දෙවැන්නෙන් කියැවෙන පරිදි පුහුදුන් සැවොම ස්වකීය වස්තුවට ඇලුම් කරති. එය වෙනත් අයකු විසින් සොරකම් කරනු ලැබීමෙන් වස්තු හිමියාට ඇති වන සිත් පීඩාව හා පාඩුව සැමට ම පොදු ය. මේවාට ජාති, ආගම්, කුල භේදයක් නොමැත. කය ද කායික වින්දනය ද වැරැදි ලෙස භාවිත කිරීමෙන් වැළකීම තෙවැනි සිකපදයෙන් කියවේ. එයින් වැළකීම මිනිස් සමාජයේ ශිෂ්ටත්වය හා සුහදතාව ආරක්ෂා වීමකි. බොරු කීම යනු අන්‍යයන් රවටන හැඟීමෙන් වංචාකාරී අදහසින් යුතු ව යමක් පැවසීමයි. සුරාවෙන් වැළකීම කායික මානසික නීරෝගීතාව මනා ව ආරක්ෂා වීමට බලපායි.

බුදුරජාණන් වහන්සේ අනුන්ගේ දියුණුව උදෙසා ක්‍රියා කිරීම ආදර්ශයෙන් ම පෙන්වා දුන්හ. අප එය ක්‍රියාවට නැගීමේ දී ද කිසිදු ජාති, ආගම්, කුල භේදයක් අදාළ කරගත යුතු නොවේ. අනුන් යනු තමා හැර සියලු ම දෙනා බව සිහියේ තබාගත යුතු ය. කෙතෙක් යහතින් ජීවත් වුව ද යමකු ඕනෑ ම අවස්ථාවක අසරණ භාවයට පත්වීමට ඉඩකඩ ඇත. ඇතැම් විට රෝගපීඩා, ගංවතුර, සුළි සුළං, නායයෑම්, නියගය ආදි විපත් මෙයට බලපෑ හැකි ය. මෙබඳු විපත් ජනතාවට උදාවන්නේ ජාතියක්, ආගමක්, කුලයක් බලා නොවේ. එබැවින් සෑම විටක ම එකී භේද නොසලකා අසරණ වූවන්ට උපකාර කිරීම ද බුදුදහම අනුගමනය කිරීමකි.

සැප දුක දෙකෙහි දී ම තමා හා අනුන් සමාන ලෙස සලකා ක්‍රියා කිරීමේ මාහැඟි ගුණාංගය සමානාත්මතාවයි. මෙය මිනිස් සමාජය තුළ පිරිහෙමින් පවත්නා බවක් පෙනේ. මෙම සමානාත්මතාව මෙරට බෞද්ධයන් ලෙස අප මැනැවින් ප්‍රගුණ කළ යුතු ගුණාංගයක් වන අතර එයට ද කිසි සේත් ම ජාති, ආගම්, කුල භේද අදාළ කරගත යුතු නොවේ. තව ද නූතන සමාජය තුළ ඇතැමුන් අන්‍ය මත ඉවසීම කෙරෙහි එතරම් නිවැරැදි ප්‍රතිචාරයක් දක්වන බවක් නොපෙනේ. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වන අවධියේ බොහෝ මිථ්‍යා මත දරූ ආගමික නායකයෝ සිටියහ. ඒ සෑම දෙනෙක් ම ස්වකීය දහම හුවා දැක්වූ අතර අන් සියලු දහම් හෙළා දුටුවහ. එහෙත් බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ කවරකු පැවසුව ද නිවැරැදි අර්ථවත් දේ පිළිගැනීමත් එසේ නොවන දේ බැහැර කිරීමත් සිදු කළ යුතු බවයි.




සාමයෙන් හා සහජීවනයෙන් ජීවත් වීමට නම් සියලු ආගම් ඇදහිය යුතු යැයි යමකු අදහස් කළහොත් එය සහමුලින් ම වැරැදි සහගත බව ද අප තේරුම් ගත යුතු ය. සියලු ම ආගම් ඇදහීම උමතු ස්වභාවයක් මිස ආගමික සහජීවනය නොවේ. එකී වැරැදි පිළිවෙතින් ඈත් ව ආගමික සහජීවනය ගොඩනැගෙන උතුම් ක්‍රියාකාරකම් මෙසේ පෙන්වා දිය හැකි ය. වෙසක් පොහොයට අන්‍ය ආගමිකයෝ වෙසක් පහන් කූඩු තනති. තොරණ ඉදිකිරීමට ද සහාය වෙති. ආධාර උපකාර කරති. දන්සල් දෙති. බෞද්ධයෝ ද අන්‍ය ආගමිකයන්ගේ හා අන්‍ය ජාතීන්ගේ උත්සවවලට උදවු උපකාර කරති. තම නිවෙස් හෝ ආයතන හෝ ඒ වෙනුවෙන් සරසති. එසේ ම පන්සලේ ධර්ම ශාලාව හෝ ප්‍රජා ශාලාව ඔවුන්ගේ සමාජ සේවා රැස්වීම් ආදිය සඳහා ලබාදෙති. මේ අනුව සහජීවනයේ නියම ලක්ෂණය වන්නේ අන්‍යයන්ගේ ආගම හෝ සිරිත විරිත හෝ තමනුත් අනුගමනය කිරීම නොව ඔවුන්ගේ ආගම ඇදහීමට, ඔවුන්ගේ සිරිත් විරිත් ඔවුන්ට පවත්වාගෙන යාමට බාධා නොකිරීමයි; උපකාර කිරීමයි. සිංහල බෞද්ධයෝ පෙර සිට ම මෙම පිළිවෙත අනුගමනය කළෝ ය. සුහදත්වයෙන් යුතු ව අනුගමනය කරන මෙම උතුම් පිළිවෙත සහජීවනයයි. සිංහලකමත්, බෞද්ධකමත් ආරක්ෂා කර ගනිමින් සහජීවනයෙන් කටයුතු කිරීම අප සැමගේ වගකීම වේ.

## සාරාංශය

සිංහලයා පෝෂණය ලැබූයේ බෞද්ධ සංස්කෘතියෙනි. ඒ තුළින් ලත් ශික්ෂණය ඔස්සේ සාමයෙන් හා සහජීවනයෙන් ජීවත් වීමට හුරු වූ ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතාව ඉතා විශිෂ්ට මට්ටමක පවතියි. සිංහලයා ලොව අන් එක ද ජාතියකට වත් නොදෙවෙනි තත්ත්වයකට උරුමකම් ලබා ඇත්තේ පංච සීල ප්‍රතිපත්තිය, පරෝපකාරය, සතර බ්‍රහ්ම විහරණය හා සමානාත්මතාව යනාදී උසස් බෞද්ධ ඉගැන්වීම් පිළිපැදීම නිසා ය. ජාතික ආගමික සහජීවනය අඛණ්ඩ ව පවත්වාගත හැක්කේ ද එම උසස් ප්‍රතිපත්ති ආරක්ෂා කිරීම මගින් පමණකි.

## ක්‍රියාකාරකම

1. "ශ්‍රී ලංකා සංස්කෘතියත් බෞද්ධ සංස්කෘතියත් යනු දෙකක් නොව එකකි." මේ පිළිබඳ රචනයක් ලියන්න.
2. "අපි සැවොම ලක් මෑණියන්ගේ දරුවෝ වෙමු" යන මැයෙන් ශිෂ්‍ය සමිතියේ කතාවක් ඉදිරිපත් කරන්න.

## පැවරුම

වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි, යනුවෙන් තිබූ අපේ සංස්කෘතියට බටහිර සංස්කෘතියෙන් බලපෑමක් එල්ල වී තිබේ ද? නැද් ද?
පන්තිය කණ්ඩායම් දෙකකට බෙදී විවාදයක් පවත්වන්න.